**කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර**

**ව්‍යාපාර සංඛ්‍යානය - 13 ශ්‍රේණිය**

**ඒකක පරීක්ෂණය - 10.0 කළමනාකරණ තීරණ ගැනීමට සංඛ්‍යාන තත්ත්ව පාලන ශිල්පීය ක්‍රම භාවිත කරයි.**

1. නිෂ්පාදිතයක ගුණත්වය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
2. නිෂ්පාදිතයක ගුණත්වය වෙනස්වීමට බලපාන හේතු නිදසුන් මගින් පැහැදිලි කරන්න.
3. සංඛ්‍යාන තත්ත්ව පාලනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
4. සංඛ්‍යාන තත්ත්ව පාලනයේ ප්‍රයෝජන ලියා දක්වන්න.
5. ක්‍රියාවලි පාලනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.
6. පාලන සටහන්වල ප්‍රයෝජන පැහැදිලි කරන්න.

එක්තරා සහල් මෝල් හිමියෙක් 25kg ක් වන සහල් මලු වෙළෙඳපොළට ඉදිරිපත් කරයි. ඔහු ඉදිරිපත් කරන සහල මල්ලක ශුද්ධ බරෙහි මධ්‍යන්‍යය $\mu' = 24.9kg$ හා සම්මත අපගමනය ලෙස $\sigma' = 1.5kg$ ප්‍රමිති නියම කර ඇතැයි සිතන්න. මෙම ක්‍රියාවලියෙන් වරකට සහල් පැකට් 12 බැගින් වන නියැදි 10ක් පරීක්ෂා කරන ලදී. එක් එක් නියැදියේ සහල් පැකට්ටුවක මධ්‍යන්‍ය බර පහත පරිදි විය.

| නියැදි අංකය | නියැදි මධ්‍යන්‍ය බර $\bar{X}$ kg |
|---|---|
| 1 | 24.85 |
| 2 | 24.92 |
| 3 | 24.76 |
| 4 | 25.01 |
| 5 | 24.96 |
| 6 | 23.82 |
| 7 | 23.24 |
| 8 | 24.65 |
| 9 | 25.73 |
| 10 | 24.52 |

මධ්‍යන්‍ය පාලන සටහන සඳහා පාලන සීමා ගණනය කර ක්‍රියාවලිය පාලනයෙන් තොර දැයි පෙන්වා දෙන්න.